// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2228/30 - 2021 මැයි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2021.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (X) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 94112 දරන සමාගමක් වන ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2019 සැප්තැම්බර් මස 3 වැනි දින අංක 2139/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ II වන උපලේඛනය මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "තොරතුරු තාක්ෂණවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන හා II වන තීරයන් හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, 2019 සැප්තැම්බර් මස 3 වැනි දින අංක 2139/25 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව සඳහන් 1 වන, 2 වන, 3 වන හා 4 වන කොන්දේසිවලට අනුකූල විය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය (SLQF6) සම්බන්ධයෙන් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඊට ඇඳුණු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

3. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) උපාධිය | බී බී එම් (ගෞරව) |

මහාචාර්ය **ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ දී ය.

06 - 37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.